ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

# <u>පුවත්පත් නිවේදනය</u>

## <u>ශ්‍රී ලාංකික සිසු සිසුවියන් 22 දෙදෙනකුට ඉන්දියාවේ දී හින්දි භාෂාව ඉගෙනුමට පූර්ණ ශිෂ්‍යත්ව</u>

ඉන්දියානු රජය විසින් දිවයින පුරා සිටින ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසි දෙදෙනෙකුට ඉන්දියාවේ දී හින්දි භාෂාව ඉගෙන ගැනීම සඳහා පූර්ණ ශිෂ්‍යත්ව පිරිනමන ලදී. මෙම සිසු පිරිස උත්තර් ප්‍රදේශ්, අග්‍රා හි කේන්ද්‍රීය හින්දි සංස්ථාන් හිදි නව මාසික ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරනු ඇත. ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 26ක සිසු සිසුවියන් සඳහා මෙම ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ශිෂ්‍යත්ව හිමි විය.

2. ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා ශිෂ්‍යත්වලාභීන් පිරිස දිවයිනෙන් පිටත් වීමට පෙර 2023 අගෝස්තු 29 වන දින හමු වූ අතර ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වසර දහස් ගණනක් පැරණි සංස්කෘතික, භාෂාමය, සාහිත්‍යමය සහ ආගමික බැඳීම් ශක්තිමත් කිරීමෙහි ලා හින්දි භාෂාවේ සහ සාහිත්‍යයේ භූමිකාව අවධාරණය කළේය. එතුමා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඉන්දියාවේ අධ්‍යයන කටයුතු සඳහා සිය සුබපැතුම් ද පිරිනැමීය.

3. ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම භාෂාවක් වන හින්දි ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ පාසල් සහ විශ්ව විද්‍යාල ඇතුළු ආයතන 80කට ආසන්න ප්‍රමාණයක උගන්වනු ලැබේ.

4. ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය මෙම ශිෂ්‍යත්ව වැඩසටහන 2011 වසරේ සිට සම්බන්ධීකරණය කරයි. පසුගිය වසර 12 තුළ ශ්‍රී ලංකාවෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 160 දෙනෙකුට මෙම "විදේශයන්හි හින්දි ප්‍රචලිත කිරීම"

යන ශිෂ්‍යත්වය ලබා දී ඇත. ශ්‍රී ලංකාවෙන් වැඩිම ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිස මෙම වසරේදී තෝරා ගන්නා ලදී.

***

කොළඹ
2023 අගෝස්තු 31